සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Cmmonwealth
SBS - 063619
Ac - 10852409

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්4ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත



# විනයක් නැති රටක්

## අජිත් පැරකුම් ජයසිංහ



තට්ටයගෙ කොලම බ්ලොගය කරන මංජුල ඊයේ දුරකථනයෙන් කතා කළා. ඔහු සමග කළ කතා බහේ තිබුණු වැදගත් අදහස් අතරින් එකක් ගැන වැඩිදුර ලිවිය යුතු යයි සිතුණා.

ලංකාවේ මිනිසුන්ට තිබෙන්නේ සංවර්ධනය පිළිබඳ ප්‍රශ්නයකටත් වඩා විනය පිළිබඳ ප්‍රශ්නයක් ය කියන එකයි ඔහු කියූ කාරණය.

මේක ඇත්ත. ලංකාවේ මිනිසුන් පාරේ පයින් ගමන් කළ යුතු පැත්ත හෝ දන්නෙ නැහැ. තුන්මුල්ල හංදියේ කහ ඉර ගාව සිටි පොලිස් නිලධාරියා ඊයේ උදේ මා එතන සිටගෙන සිටි විනාඩියක විතර කාලය තුළ හතර වතාවක් පේමන්ට් එකට කෙළ ගැහුවා. ගෙදර යනකොට ඒසී බස්සෙකේ සිටි තරුණයෙක් වායුගෝලයට කිඹුහුම් ගණනාවක් ම මුදා හැරියා. වාහන පදවන්නේ රියදුරන්ට වඩා චන්ඩි. බොහෝ රජයේ කාර්යාලවල විතරක් නෙමෙයි, ඇතැම් පෞද්ගලික සමාගමකින් පවා අදාළ නිලධාරියකුගෙන් තොරතුරක් ඇහුවත් ඒගොල්ලන් උත්තර දෙන්නෙ තරහින්. කෑම විකුණන කඩවල වැඩ කරන අය පුක කහ කහා කෑම අතගානවා.

හැබැයි මේ මිනිසුන් ම වුණත් විනයක් සහිත රටකට ගිහින් දැම්මොත් හොඳට හැසිරෙන්නට දන්නවා. අපේ මිනිසුන්ට එහෙම වෙලා තියෙන්නෙ ඇයි?

මේ මිනිසුන්ගෙන් ම ඇහුවොත් කියයි රටේ නීතිය ක්‍රියාත්මක නො වෙන එක තමයි ඒවාට හේතු කියලා. හැබැයි, නීති කඩනවා ද බලන්න හැම මිනිහෙකු ම පිටුපසින් පොලිස් නිලධාරියකු දමන්නට රජයකට පුළුවන්කමක් නැහැ. ඇයි අපේ මිනිසුන්ට බැරි තම තමන් නීති ගරුක වන්නට?

සියල්ලට වග කිව යුතු ආණ්ඩුව ය කියන අදහසත්, හැම දෙයකට ම ආණ්ඩුවට බැනීමත් හරිම සුලබව දැකිය හැකි තත්වයක්. හැබැයි, මේ බොහෝ දෙනෙකු ආණ්ඩුවයි, රජයයි අතර වෙනසවත්

**සියල්ල රජයෙන් නොමිළේ දිය යුතුයි කියන අදහස ලංකාවේ ස්ථාපිත වුණේ මාක්ස්වාදී බලවේගවල බලපෑමෙන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු යටතේයි. උදාහරණයක් ලෙස, උසස් අධ්‍යාපනයත් නොමිළේ දීලා, එයින් බිහි වන කුසලතා රහිත උපාධිධාරීන්ට රැකියාත් රජයෙන් ම දිය යුතුයි කියා තමයි ලංකාවේ මිනිසුන් හිතන්නේ.**

දන්නෙ නැහැ. ආණ්ඩුව පුද්ගලයන් වශයෙන් ගත්තොත් 500කට අඩු පිරිසක්. රජය එහෙම නෙමෙයි. විශ්‍රාමිකයිනුත් එක්ක ලක්ෂ 20ක්.

අපි ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පිළිබඳ ප්‍රශ්නය ගනිමු. මේ තෙල්

8 වන පිටට

මෙම ස්ථානයේ වෙළඳ දැන්වීම් සඳහා විමසන්න - අසෝක 0432 391 922

